# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.04.11 පැය 0020 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/703 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**රථවාහන වැරදි වලට අදාල ක්ෂණික දඩ මුදල් GovPay යෙදවුම මඟින් ගෙවීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම - පොලිස් මූලස්ථානය.**

CLEAN SRI LANKA ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා පොලිසිය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතියක් ලෙස GovPay යෙදවුම හරහා මාගර්ගත ක්‍රමය ඔස්සේ (Online) රථවාහන වැරදි වලට අදාලව ක්ෂණික දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.

දැනට ක්‍රියාත්මක ක්‍රමවේදය වන්නේ, රියදුරන් විසින් සිදුකරනු ලබන රථවාහන වැරදි සඳහා පොලිස් නිලධාරින් විසින් නිකුත් කරන ලද දඩ පත්‍රිකා තැපැල් කාය්‍රාල වෙත රැගෙන ගොස් ගෙවීම් සිදුකර එම කුවිත්නාසි පත නැවත පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රියදුරු බලපත්‍රය ආපසු ලබා ගැනීමයි.

නමුත් GovPay යෙදවුම හරහා මාගර්ගත ක්‍රමය ඔස්සේ දඩ මුදල ගෙවීම සිදුකර එය කෙටි පණිවිඩයක් ඔස්සේ රථවාහන නිලධාරින් වෙත තහවුරු කිරිමෙන් අනතුරුව එම අවස්ථාවේදීම රියදුරු බලපත්‍රය මුදා හැරීම සිදුවන බැවින් මහජනතාවට අපහසුවකින් තොරව කායර්ක්ෂම සේවාවක් ලබාදීමේ අවස්ථාව සැලසේ.

ඒ අනුව මෙම නියමු ව්‍යාපෘතිය 2025.04.11 වන දින සිට 2025.04.30 වන දින දක්වා කුරුණෑගල, දොරටියාව, මැල්සිරිපුර, ගොකරැල්ල, ගලේවෙල, දඹුල්ල, මඩාටුගම, මරදන්කඩවල, කැකිරාව, තිරප්පනේ , කවරක්කුලම හා අනුරාධපුර යන ප්‍රදේශවල මාගර් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ.

ඒ තුලින් මෙම නියමු ව්‍යාපෘතිය තුලදී සිදුවන අපහසුතා හා අඩුපාඩු හඳුනාගෙන ඒවා සකස් කර ගැනීමෙන් පසු දිවයින පුරා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලිසිය අපේක්ෂා කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**